# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 -2484500, 011- 2484600, 011- 2484700
ෆැක්ස් / தொலை நகல் / Fax: 011- 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: MF1/01/05/02/2026 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2025.09. 08 |

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති
සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ
අමාත්‍යාංශයේ අංශ ප්‍රධානීන් වෙත,

**<u>ඒකාබද්ධ සේවයේ අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරු අභියාචනා - 2026</u>**
**<u>භාෂා පරිවර්තක සේවය / සංවර්ධන නිලධාරි සේවය / කළමනාකරණ සේවා නිලධාරි සේවය / රියදුරු සේවය / කාර්යාල සේවක සේවය</u>**

2026 වර්ෂය සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරිම අනුමතකර ඇති අතර එම ස්ථාන මාරු උපලේඛන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පලකර ඇත.

02. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධව අභියාචනා වෙතොත්, රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01)හි XVIII පරිච්ඡේදයේ 253(V) උපවගන්තිය ප්‍රකාරව අංක 15 පරිශිෂ්ටයේ දක්වා ඇති ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අභියාචනා 2025.09.15 දින හෝ ඊට පෙර මා වෙත එවීමට කටයුතු කළ යුතු අතර එදිනට පසුව ලැබෙන අභියාචනා සම්බන්ධයෙන් සලකාබැලීමට නොහැකි බව සියලුම නිලධාරීන් වෙත දැනුම් දීමට ද කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. (එම ආකෘතියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

03. විවෘත / සීමිත තරඟ විභාග ප්‍රතිඵල මත කළමනාකරණ සේවා නිලධාරී සේවයට බඳවාගත් නිලධාරීන්ගේ පරිවාස කාලය / වැඩබැලීමේ කාලය සම්පූර්ණවීමට පෙර මෙම අමාත්‍යාංශයට ස්ථාන මාරු ලබා ඇත්නම් එම පරිවාස කාලය / වැඩබැලීමේ කාලය සම්පූර්ණ වන දිනය මෙම අමාත්‍යාංශයට පැමිණි දිනය ලෙස සැලකේ. ඒ සම්බන්ධයෙන් එවැනි නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ එම නිලධාරීන් මෙම අමාත්‍යාංශයට පැමිණි දිනයේ හෝ අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකර ඇති උපලේඛනවල සඳහන් අනෙකුත් තොරතුරුවල හෝ කිසියම් වෙනසක් සිදුකළ යුතු නම් ඒ බව සනාථ කරගත හැකි ලියවිලිද සමග තම දෙපාර්තමේන්තු ප්‍රධානී මගින් ලිඛිතව මා වෙත දැන්වීමට කටයුතු කරන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ලේකම් වෙනුවට